# අධ්‍යාපන අමාත්‍යාංශය - කෘෂිකර්ම හා පරිසර අධ්‍යයන ශාඛාව

**අ.පො.ස. ( උ.පෙළ) විභාගය - 2018 සඳහා පෙරහුරු ප්‍රශ්න පත්‍රය**

| කෘෂි විද්‍යාව II | 8 | S | II | පැය දෙකයි |
|---|---|---|---|---|

## B කොටස - රචනා

**උපදෙස් :**

- ❖ ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.
- ❖ අවශ්‍ය තැන්හි දී නම් කරන ලද පැහැදිලි රූප සටහන් දෙන්න.
  (එක් එක් ප්‍රශ්නය සඳහා නියමිත ලකුණු ප්‍රමාණය 150 කි.)

**1.** (i) දේශගුණික විපර්යාස මගින් කෘෂි ක්ෂේත්‍රයට විය හැකි බලපෑම හා ඒවා අවම කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග පැහැදිලි කරන්න.

(ii) රසායනික පොහොර මිශ්‍ර පොහොර ලෙස බෝගවලට යෙදීමේ අවාසි විස්තර කරන්න.

(iii) එළවළු වගාව සඳහා සම්මත බීජ නිෂ්පාදනය කරන ගොවිමහතෙකු විසින් ඒවායේ ගුණාත්මකභාවය ආරක්ෂා කර ගැනීම පිණිස අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග පැහැදිලි කරන්න.

**2.** (i) කෘෂිකාර්මික භූමියක පාංශු ඛාදනය අවම කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග විස්තර කරන්න.

(ii) "ජාන සම්පත් සංරක්ෂණය" යන්න නිර්වචනය කර ජාන සම්පත් විනාශ වීමට බලපෑම් කරන මිනිස් ක්‍රියාකාරකම් විස්තර කරන්න.

(iii) ආහාර නිෂ්පාදනය සඳහා ප්‍රමිති පවත්වා ගැනීමේ වැදගත්කම් පැහැදිලි කරන්න.

**3.** (i) සත්ව ගොවිපළක රෝග වළක්වා ගැනීමේ වැදගත්කම සඳහන් කර කුකුළු ගොවිපළක රෝග පාලනය සඳහා අනුගමනය කළ හැකි පිළිවෙත් විස්තර කරන්න.

(ii) බෝග වගා කිරීමේ දී රසායනික පළිබෝධනාශක භාවිතයේ අහිතකර බලපෑම් විස්තර කරන්න.

(iii) බෝග වගාව කෙරෙහි පාංශු ක්ෂුද්‍ර ජීවීන්ගෙන් ඇති වන බලපෑම පැහැදිලි කරන්න.

**4.** (i) ශ්‍රී ලංකාවේ නූතන කෘෂිකාර්මික අභියෝග විස්තර කරන්න.

(ii) කොම්පෝස්ට් නිපදවීමේ ක්‍රියාවලියේ දී අනුගමනය කරන ක්‍රියාකාරකම්වල වැදගත්කම පැහැදිලි කරන්න.

(iii) කුකුළු ගොවිපළක කාර්යක්ෂමතාව වැඩි කිරීම සඳහා පිටලෑම සිදු කරනු ලැබේ. බිත්තර නිෂ්පාදනය සඳහා කිකිළියන් ඇති කිරීමේ දී පිටලෑමේ අවස්ථා විස්තර කරන්න

**5.** (i) ගෙවත්තක් සැලසුම් කර තිරසරව පවත්වාගෙන යාමේ දී සම්පත් මනාව කළමනාකරණය කිරීම සඳහා ගන්නා ක්‍රියාමාර්ග විස්තර කරන්න.

(ii) කෘෂි ව්‍යාපාරයක් මනාව පවත්වා ගැනීමේ දී ව්‍යාපාර සැලැස්මක අවශ්‍යතාව පැහැදිලි කරන්න.

(iii) පාලිත පරිසර තත්ත්ව යටතේ බෝග වගාවේ දී ඇතිවන ගැටලු සාකච්ඡා කරන්න.

**6.** (i) බෝගයක් සඳහා ජල සම්පාදන අවශ්‍යතාව කෙරේ බලපාන සාධක විස්තර කරන්න.

(ii) ගැබ් ගත් දෙනක් වියලි කිරීම දක්වා පාලනය කිරීමේ දී සැලකිය යුතු සාධක විස්තර කරන්න.

(iii) උත්ස්වේදනයේ වැදගත්කම සඳහන් කර උත්ස්වේදනය පාලනය කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග පැහැදිලි කරන්න.